# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 1961/30 – 2016 අප්‍රේල් 07 වැනි බ්‍රහස්පතින්දා – 2016.04.07**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/25/2012.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වැනි පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2015 අගෝස්තු මස 31 වැනි දින අංක 1930/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2015 අගෝස්තු මස 20 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. පී. කේ. වීරරත්න මයා, කුඩාගම, දොඹේමඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ප්‍රධාන කාර්යාලය, ගාලු පාර, රත්මලාන.

අතර පවත්නා 2015 අගෝස්තු මස 05 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පාලිත වීරසේකර මහතා වෙත යොමු කරන ලදී.

යථොක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2015 අගෝස්තු මස 20 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.

04 - 872/1


1A – G 23277 – 102 (2016/04)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/10/25/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. පී. කේ. වීරරත්න මයා, කුඩාගම, දොඹේමඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ප්‍රධාන කාර්යාලය, ගාලු පාර, රත්මලාන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 06, ඩබ්ලිව්. ඒ. සිල්වා මාවත, ඒ. පී. ටී. 503, අංක 181/1, ටී. ඒ. සාන්තරාජන් මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/25/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. පී. කේ. වීරරත්න මයා, කුඩාගම, දොඹේමඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ප්‍රධාන කාර්යාලය, ගාලු පාර, රත්මලාන.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

01. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ලිපිකරුවෙකු ලෙස සේවය කර ඇති ඒ. පී. කේ. වීරරත්න මහතා සම්බන්ධයෙන් 2001.08.29 දිනැති ස්ථිර හා 2000.08.10 දිනැති අනියම් පත්වීම් ලිපිවලට සහ බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටියට අනුව ඔහුට උසස්වීම්, වැටුප් වර්ධක හා විශ්‍රාමික පාරිතෝෂිකය නොලැබීම.

02. 2010.11.08 දිනැති නැවත සේවයේ පිහිටුවාලීමේ ලිපිය මගින් 2007.07.11 දින සිට 2010.11.10 දින දක්වා කාලයට වැටුප් රහිත කිරීම හා එම කාලයට හිමි සියළු වරප්‍රසාද අහිමි කිරීම හා

03. වෛද්‍ය සහතිකය ඉදිරිපත් කර තමන් අසනීප බව මණ්ඩලයට දන්වා තිබියදීත් නොදන්වා සේවයට නොපැමිණියා සේ සලකා 2007.10.08 දිනැති සේවය අතහැර යාමේ නියෝගයක් නිකුත් කිරීම.

යන කාරණා යුක්ති සහගත වන්නේ ද යන්න හා එසේ නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 - 872/2

---

මගේ අංකය: IR/COM/05/E/2014/100.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10. (එච්. එම්. පී. සිල්වා මහතා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ක්‍රිසි ෆුඩ්ස් ලිමිටඩ්, අංක 98, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් දිවුලපිටිය, මාපලන්ගෙදර, අංක 160, කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/E/2014/100.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10. (එච්. එම්. පී. සිල්වා මහතා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ක්‍රිසි ෆුඩ්ස් ලිමිටඩ්, අංක 98, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

ක්‍රිසි ෆුඩ්ස් ලිමිටඩ් ආයතනයේ සේවය කරන එච්. එම්. පී. සිල්වා මහතා 2014.06.11 දින සිට අංක 98, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 ලිපිනයේ පිහිටි ගබඩා අංශය වෙත මාරු කිරීම යුක්ති සහගත ද යන්න හා එසේ මාරු කිරීම අයුක්ති සහගත නම් ඔහුට හිමි විය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 මාර්තු මස 01 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

04 - 873

---

මගේ අංකය: IR/13/17/2008.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වැනි පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2010 ජනවාරි මස 21 වැනි දින අංක 1637/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010 ජනවාරි මස 15 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. ඩබ්ලිව්. සමරසූරිය මයා, "සමරසිරි", කෝට්ටේගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2009 දෙසැම්බර් මස 10 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩබ්ලිව්. ජී. ඩීන් මහතා වෙත යොමු කරන ලදී.

යථොක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2010 ජනවාරි මස 15 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.

04 - 874/1

---

මගේ අංකය: IR/13/17/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. ඩබ්ලිව්. සමරසූරිය මයා, "සමරසිරි", කෝට්ටේගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128 හි, එස්. විරිතමුල්ල මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/13/17/2008.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. ඩබ්ලිව්. සමරසූරිය මයා, "සමරසිරි", කෝට්ටේගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 2007.09.05 දිනැති මාණ්ඩලික අනුකාරක සභා අභියාචනා නියෝගය අනුව රුහුණු ප්‍රාදේශිකයේ III බී ශ්‍රේණියේ නිලධාරී ඒ. ඩබ්ලිව්. සමරසූරිය මහතා වෙත පමුණුවනු ලැබූ දඬුවම් යුක්ති සහගතද යන්න හා යුක්තිසහගත නොවේ නම්, ඔහුට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 පෙබරවාරි මස 12 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 - 874/2

---

මගේ අංකය: IR/COM/04/S/2014/79.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. ජේ. එම්. පී. ජී. වයි. බී. ජයසේකර මයා, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (නැගෙනහිර), ත්‍රිකුණාමලය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, තැ. පෙ. 14, ගාලු පාර, රත්මලාන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිලියන්දල, නාම්පමුණුව, කුමුදු මාවත, අංක 89/එෆ්, සුනෙත් ලොකුබෝගහවත්ත මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/S/2014/79.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. ජේ. එම්. පී. ජී. වයි. බී. ජයසේකර මයා, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (නැගෙනහිර), ත්‍රිකුණාමලය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, තැ. පෙ. 14, ගාලු පාර, රත්මලාන.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

01. ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ මනු සටහන් පරීක්ෂක ලෙස සේවය කරනු ලබන ආර්. ජේ. එම්. පී. ජී. වයි. බී. ජයසේකර මහතා හට 2008.04.07 වැනි දින සිට පුහුණු කිරීමේ නිලධාරි තනතුර ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම යුක්ති සහගතද යන්න සහ

02. ඔහු 2008.04.07 දින සිට 2014.06.05 දින දක්වා පුහුණු කිරීමේ නිලධාරි තනතුරෙහි වැඩ ආවරණය කිරීම වෙනුවෙන් වැඩ ආවරණය කිරීමේ දීමනාව ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද යන්න හා එලෙස යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 - 875

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.